**ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාගය**
**ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ / මධ්‍යම / අවසාන විභාගය-2024(2025)**
**උත්තර පත්‍ර නැවත සමීක්ෂණය කිරීම**

**Examinations of the Oriental Studies Society of Sri Lanka**
**Oriental Pandith Basic / Intermediate / Final Examination – 2024 (2025)**
**Re-Scrutiny of Answer Scripts**

**இலங்கை பிராச்சீன பாகோஸ்வர சங்கத்தின் பரீட்சை**
**பிராச்சீன பண்டித ஆரம்பம் / இடைநிலை / இறுதிப் பரீட்சை - 2024 (2025)**
**விடைத்தாள் மீள் பரிசீலனை**

# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග
## ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාගය - 2024 (2025)
## උත්තර පත්‍ර නැවත සමීක්ෂණය

උක්ත විභාගයේ උත්තර පත්‍ර නැවත සමීක්ෂණය කිරීම සඳහා වන අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය 2025.10.31 වේ.

03. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීමට උපදෙස් පත්‍රිකාව සහ අයදුම්පත්‍රය සියලුම **පරිවේණාධිපතිවරුන් / ප්‍රධානාචාර්යවරුන්** හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යොමු කර ඇත. www.doenets.lk වෙබ් අඩවියේ ද උපදෙස් පත්‍රිකාව හා අයදුම්පත්‍රය බාගත කර ගැනීමේ පහසුකම් සලසා ඇත.

04. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණ ගාස්තුව **රු. 200/=** කි. (දෙසීයයකි.) තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

05. මුදල් ගෙවූ රිසිට් පතේ මුල් පිටපත අයදුම්පතේ පසුපිටේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. පසු ප්‍රයෝජනය සඳහා රිසිට් පතේ පිටපතක් ළඟ තබා ගන්න. අයදුම්පත **පරිවේණාධිපති / ප්‍රධානාචාර්ය නිර්දේශය සහිතව** පහත ලිපිනයට එවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්,**
**ආයතනික විභාග ඇගයීම් ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503, කොළඹ.**

06. නැවත සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය **එක් එක් විෂයන් සඳහා වෙන වෙනම** අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මුදල් ගෙවූ රිසිට් පත්ද වෙන වෙනම අලවා තිබිය යුතුය. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. අදාළ ගාස්තුව ගෙවා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

07. මේ සම්බන්ධයෙන් යම් විමසීමක් වේ නම් පහත සඳහන් දුරකථන අංක භාවිත කළ හැකිය.

| | |
|---|---|
| **ආයතනික විභාග ඇගයීම් ශාඛාව** | **011-2785105 / 011-2786235** |

**ජ්.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ**
විභාග කොමසාරිස් ජනරාල්

* විභාගයට අදාළ වචනය පමණක් දක්වන්න.

මගේ අංකය :- 91/2/4/03/2025 (RES)
ආයතනික විභාග ඇගයීම් ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

2025.10.

**පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ වෙත,**

**ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග - 2024 (2025)**
**ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ / මධ්‍යම / අවසාන විභාගය**
**ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම**

උක්ත විභාගයේ උත්තරපත්‍ර නැවත සමීක්ෂණය කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

- ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා මේ සමඟ එවා ඇති 2024 (2025) වර්ෂයට අදාළ ආදර්ශ අයදුම්පත්‍රයේ පිටු 02 A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසට මුද්‍රණය කරගෙන සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. **(වෙනත් ආකෘති භාර ගනු නොලැබේ).**
- මෙම ඉල්ලුම්පත් 2025.10.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

  විභාග කොමසාරිස් ජනරාල්,
  ආයතනික විභාග ඇගයීම් ශාඛාව,
  ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
  තැ.පෙ. 1503, කොළඹ.

- ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග - 2024 (2025) ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ / මධ්‍යම / අවසාන විභාගය ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම**" වශයෙන් දක්වා තිබිය යුතු ය.

**ඇගයීම් සිදුකර ඇති ආකාරය**

මෙම විභාගයේ උත්තර පත්‍ර ඇගයීම් සම්පූර්ණයෙන් ම සිදු කරන්නේ මණ්ඩල ක්‍රමයට ය. ඒ අනුව පරීක්ෂකවරුන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් මෙම උත්තර පත්‍ර ඇගයීම් කර ඇත.

**නැවත සමීක්ෂණය සිදුකරන ආකාරය**

ප්‍රතිඵල නැවත සමීක්ෂණයේ දී ප්‍රධාන පරීක්ෂකවරුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයකට යොමුකර පරීක්ෂකවරුන් දෙදෙනකුගේ පරීක්ෂාවට නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කරන උත්තර පත්‍ර යොමුකෙරේ. එහිදී අනාවරණය වන ලකුණුවල සංශෝධන ඇත්නම් ඊට අදාළ ශ්‍රේණි වෙනස්වීම් වලට නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් අනිවාර්යයෙන්ම යටත් වේ.

**ඉල්ලුම්පත් පිළියෙල කිරීමේ දී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු ය.**

01. පිරිවෙනේ අයදුම්කරුවන්ගේ නැවත සමීක්ෂණ ඉල්ලුම්පත් මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කර නිසි පරිදි සහතික කොට ලියාපදිංචි තැපෑලෙන් ඉහත ලිපිනයට එවිය යුතු ය.
02. එක් විෂයයක් නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව **රු. 200/= කි. (දෙසීයයකි.)** තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ නියමිත ගාස්තුව ගෙවා ලදුපතක් ලබා ගෙන එය ඉල්ලුම් පත්‍රයෙහි පිටුපස අදාළ ස්ථානයේ නොගැලවෙන සේ අලවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත ලිපිනයට එවන්න. ලියාපදිංචි කළ රිසිට් පත තමා ළඟ තබාගන්න. (මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම වඩාත් යෝග්‍ය වේ.)
03. මුද්දර, චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම්, භාර ගනු නොලැබේ. කුවිතාන්සිය රහිතව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
04. **එක් විෂයයක් (පිළිතුරු පත්‍රයක්) සඳහා එක් ඉල්ලුම් පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතුයි. එක් එක් ඉල්ලුම් පත්‍ර සඳහා වෙන වෙනම ලදුපත් ඉදිරිපත් කළ යුතු ය.**
05. වෙබ් අඩවියේ පළ කරන ලද ප්‍රතිඵල සටහනේ දක්වා ඇති පරිදි විභාග අංකය, විභාග මධ්‍යස්ථාන අංකය හා විභාග මධ්‍යස්ථානයේ නම, විෂය අංකය, විෂයය සහ ලැබූ ශ්‍රේණිය නිවැරදි ව සඳහන් කළ යුතු ය.
06. වැරදි තොරතුරු සපයා ඇති / අසම්පූර්ණ තොරතුරු සපයා ඇති / ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව එවනු ලබන / නියමිත ගාස්තුව ගෙවා නොමැති ඉල්ලුම් පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර එම ඉල්ලුම් පත්‍රවලට අදාළ කිසිදු ගාස්තුවක් ආපසු ගෙවනු නොලබන බව කාරුණිකව දන්වමි.

කේ.සී.එස්. ද සිල්වා
නියෝජ්‍ය විභාග කොමසාරිස්
ආයතනික විභාග ඇගයීම්

අත්. කළේ :- ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

** අනවශ්‍ය වචන කපා හරින්න.*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| |
|---|
| |

*ආදර්ශ අයදුම් පත්‍රය*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග**

**ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ / මධ්‍යම / අවසාන විභාගය - 2024 (2025)**

## උත්තර පත්‍ර නැවත සමීකෂණය කිරීම

01. i. අයදුම්කරුගේ නම :- පූජ්‍ය ………………………………………………………… හිමි / මයා /මිය / මෙනවිය (මුලකුරු සමග)

ii. පිරිවෙනේ ලිපිනය :- ……………………………………………………………………

……………………………………………………………………………………………

iii. අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

iv. අයදුම්කරුගේ දුරකථන අංකය :- | 0 | 7 | | | | | | | | |

02. i. විභාග අංකය :- | | | | | | | | |

ii. විභාග මධ්‍යස්ථානයේ අංකය හා නම :- | | |

| විෂය අංකය | | | නැවත සමීක්ෂණය කළ යුතු විෂයය (උත්තර පත්‍රය) | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | | | |

- ❖ **නැවත සමීක්ෂණය කළ යුතු එක් එක් උත්තරපත්‍රය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.**
- ❖ **එක් උත්තර පත්‍රයක් නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 200.00 කි.**

**තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිත්තාසියේ මුල් පිටපත නොගැනවෙන පරිදි පසුපිටෙහි අලවන්න. එහි ජායා පිටපතක් ඔබ ළඟ තබාගන්න. මුල් පිටපත අලවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුද්දර හෝ මුදල් ඇණවුම් හෝ භාරගනු නොලබන අතර එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

03. 2025/…../…. දිනැති කුවිතාන්සි අංක ……………………… යටතේ ……………………… තැපැල් / උප තැපැල් කාර්යාලයට රු. **200.00 (දෙසීයක්)** ගෙවන ලද බවට සහතික කරමි.

04. අයදුම්කරුගේ ප්‍රකාශය :-

මා විසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවද, යම් අසත්‍ය තොරතුරක් සපයා තිබේ නම් මෙම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබීමට ද නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන වෙනසකදී ලකුණු සහ ශ්‍රේණියේ අඩුවීමක් හෝ වැඩිවීමක් භාර ගැනීමට ද නැවත සමීක්ෂණය පිළිබඳ නීතිරීති වලින් බැඳී සිටීමට ද එකඟ වන බව මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :- 2025.10.| | |

……………………

අයදුම්කරුගේ අත්සන

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම පිරිවෙනේ ශිෂ්‍යයෙකු බවත් මෙහි දක්වා ඇති විභාග අංකය, විභාග මධ්‍යස්ථාන අංකය හා ලැබූ ශ්‍රේණිය වෙබ් අඩවියේ දක්වා ඇති ප්‍රතිඵල සටහන අනුව නිවැරදි බවත් සහතික කරමි.

…………………………

පිරිවෙනේ ලිපිනය :- ………………………………………

පරිවේණාධිපතිගේ අත්සන

නිල මුද්‍රාව තබන්න

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :- 2025.10.31 දින වේ.**
**(නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.)**
**අයදුම්පත් එවිය යුතු ලිපිනය :- විභාග කොමසාරිස් ජනරාල්,**
**ආයතනික විභාග ඇගයීම් ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ. පෙ. 1503, කොළඹ.**

***සැ.යු. :- පෞද්ගලික අයදුම්කරුවන් සඳහා පරිවේණාධිපතිගේ අත්සන හා නිල මුද්‍රාව අත්‍යාවශ්‍ය වේ.***

**මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි මෙහි අලවන්න**